# බළන්ගොඩ නගර සභාව

## 2016 වර්ෂය සඳහා බළන්ගොඩ නගර සභාවට අයත් බළන්ගොඩ බස්නැවතුම්පලෙහි පෞද්ගලික බස්ගාල් ගාස්තු අය කිරිමට සුදුසු බදු කරුවෙක් තෝරා ගැනීම සඳහා ලංසු පත් කැඳවීම

2016 පෙබරවාරි මස පළමු වන දින සිට 2016 දෙසැම්බර් මස තිස් එක් වන දින දක්වා වු ලිත් වර්ෂයක කාලයක් සඳහා පහත උප ලේඛනයේ විස්තර කරනු ලබන අයිතමය වෙනුවෙන් මුද්‍රා තබන ලද ලංසුපත් බළන්ගොඩ නගර සභාවේ ලේකම් වන මා විසින් 2016 ජනවාරි 20 වන දින පෙ.ව. 10.00 දක්වා භාරගනු ලැබේ.

**ලංසුපත් නිකුත් කිරිම:**

2016 ජනවාරි මස 19 වන දින ප.ව. 3.00 දක්වා ලංසුපත් බළන්ගොඩ නගර සභා කාර්යාලයේදි නිකුත් කරනු ලැබේ. වැඩි විස්තර කාර්යලයිය දුරකථන අංක 045-2287275 ඇමතිමෙන් හෝ www.balangoda.uc.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

**ලංසුපත් භාර ගැනීම:**

2016 ජනවාරි මස 20 වන දින පෙ.ව10.00 දක්වා ලංසු අයදුම්පත් භාරගනු ලැබේ. ඔබගේ ලංසු අයදුම් පත් නියමිත වෙලාවට පෙර නගර සභා කාර්යාලයේ තැන්පත් කර ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලිය හැකි අතරඑසේ නොමැති නම් නියමිත වේලාවට පෙර ලැබෙන සේ ලේකම්, බළන්ගොඩ නගර සභාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කල හැකිය.

**ලංසුපත් විවෘත කිරිම:**

2016 ජනවාරි මස 20 වන දින පෙ.ව. 10.30 ට ලැබී ඇති සියලු ලංසු පත් විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ලංසු අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයෙකුට හෝ සහභාගි විය හැකිය.

### උප ලේඛනය

| අනු අංක ය | කැඳවනු ලබන ලංසුවේ ස්වභාවය | ආපසු ගෙවනු ලබන ලංසු ඇප තැන්පත් මුදල | ආපසු ගෙවනු නොලබන ලංසුපත් ගාස්තු | | | | අවම වාර්ෂික ලංසු මුදල |
|---|---|---|---|---|---|---|---|
| | | | ගාස්තුව | වැට් | ජා.ගො. බ | එකතුව | |
| 04 | බළන්ගොඩ නගරයේ පෞද්ගලික බස් ගාල් ගාස්තු අයකිරිම | රු.3000.00 | රු.1000.00 | රු.130.00 | රු. 42.00 | රු.1172.00 | රු.110,000.00 |

- අවම ලංසුවට අමතරව රජය විසින් පනවා ඇති වැට් හා ජාතිය ගොඩ නැගිමේ බදු මුදල ද ගෙවිය යුතුය.
- තෝරා ගන්නා ලද බදු කරු විසින් ගිවිසුම් ඇප තැන්පත් මුදල් වශයෙන් මසයක කුළී මුදලට සමාන මුදලක් සභාවට ගෙවිය යුතු අතර, ටෙන්ඩරය පිරිනැම්මෙන් පසු ලංසුව පිලිගෙන පළමු පැය තුළ ගෙවිය යුතුය. 2016.01.31 දින වන විට ගිවිසුම් අත්සන් කළ යුතුය.
- සියළුම හෝ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනිම හෝ ප්‍රතික්ෂේප කිරිමේ අයිතිය බළන්ගොඩ නගර සභාව සතුය.

2016 ජනවාරි මස 04 වන දින,
බළන්ගෙඩ නගරසභාවේ දීය.

එම්.එච්.සීලවති,
ලේකම් හා බළන්ගොඩ නගරසභාවේ
බලතල, කාර්යය හා කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී

# බළන්ගොඩ නගර සභාව

## ටෙන්ඩර් අයදුම්පත්‍රය

බළන්ගොඩ බස්නැවතුම්ලලෙහි පෞද්ගලික බස්ගාල් ගාස්තු අය තිරීම සඳහා 2016 පෙබරවාරි මස 01 වන දින සිට 2016 දෙසැම්බර් මස 31 දක්වා බදු ගැනීම සඳහා වූ ටෙන්ඩර් ඉල්ලීම

1. ටෙන්ඩර් අයදුම් පත්‍ර නිකුත් කළ දිනය :
2. අයදුම් පත්‍රය නිකුත් කරන ලද්දේ කාටද යන වග :
3. ලිපි ලැබෙන පිළිවෙල :
4. තැන්පත් කරන ලද මුදල හා කුවිතාන්සි අංකය :
5. නිකුත් කරන නිලධාරියාගේ අත්සන :
6. ටෙන්ඩර් අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය :
7. දුරකථන අංකය :
8. ටෙන්ඩර් අයදුම්කරුගේ අත්සන :

.......................................................

ලේකම්,
බළන්ගොඩ නගර සභාවවේ බලතල,
කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක
කිරීමේ නිළධාරී.

බළන්ගොඩ බස්නැවතුම්පල පෞද්ගලික බස්ගාල් ගාස්තු 2016 පෙබරවාරි මස 01 වන දින සිට 2016 දෙසැම්බර් 31 වන දින දක්වා අය කිරීමේ ටෙන්ඩරය සඳහා ..................................................................................................................................
............................................................................... ලිපිනයේ පදිංචි ...............................................................................................
වන මම රුපියල් ...............................................................................................................(රු ..................................)
ක් මෙයින් ඉල්ලුම් කරමි.

දිනය :

.............................................
ටෙන්ඩරුකරුගේ අත්සන

# කොන්දේසි පත්‍රය

බළන්ගොඩ බස්නැවතුම්පලෙහි පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමේ ගාස්තු වශයෙන් මාසිකව රු. ........................................ ක මුදලක් 2016 පෙබරවාරි මස 01 වන දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා අඛණ්ඩව ගෙවීමට කටයුතු කළයුතු වන්නේය.

- එක් බස් රථයකින් එක් දිනකට අයකල හැකි උපරිම මුදල වනුයේ රු.50.00 කි.
- සෑම මසකම ටෙන්ඩර් මුදල ඊළග මාසයේ 10 වන දින හෝ ඊට පෙර ගෙවිය යුතුය.
- ප්‍රමාද වන එක් එක් දින සඳහා රුපියල් 250.00 ක අතිරේක ගාස්තුවක් ගෙවිය යුතුය.
- රජය විසින් අනුමත කරනු ලබනු ලබන සියලු බදු මුදදු ද ගෙවිය යුතුය.
- අදාළ ගාස්තුව රජයේ විශේෂ නිවාඩු දින හෝ වෙනත් විශේෂ දිනයන් සඳහා කිසිදු හේතුවක් නිසා ගාස්තු අඩු කරනු නොලැබේ
- සෑම බස් රථයකින්ම අය කරනු ලබන මුදලට සරිලන, නගර සභාවේ මුද්‍රාව තබන ලද වලංගු ලදුපතක් නිකුත් කළ යුතුය.
- බස් රථ වලින් මුදල් අය කරන්නන් පහසුවෙන් හදුනා ගැනීම සඳහා නගර සභාව අනුමත කළ නිල ඇඳුමක් සපයා දිය යුතුය.
- මුදල් අය කිරීම සඳහා යොදවා ඇති අයගේ සියලු තොරතුරු නගර සභාවට ඉදිරිපත් කර නගරසභාවේ සහතික කළ හැඳුනුම්පතක් ලබාගැනීමට කටයුතු කළ යුතුය.
- බස් රථ රියදුරන් සමග විනීතව හැසිරිය යුතුය.
- පොලිසිය විසින් පනවනු ලැබ ඇති සහ පනවනු ලබන, මාර්ග නීති රීති පිළිපැදිය යුතුය.
- සාධාරණත්වය හා සාමය ආරක්ෂාවන අයුරින් ගාස්තු අය කිරීම සහ අනෙකුත් කටයුතු සිදු කළ යුතුය.
- ගාස්තු අය කිරීමේදී පුද්ගලයෙකු සම්බන්ධයෙන් හෝ වෙනයම් අවස්ථාවකදී ගැටලු සහගත තත්ත්වයක් මතු වුව හොත් වහාම බළන්ගොඩ නගර සභාවේ ආදායම් පරීක්ෂක හෝ ලේකම් හෝ සභාපතිවරයාට හෝ දැන්විය යුතුය.
- වාහන නැවතුම් ගාස්තු අය කිරීමේ කටයුතු අධීක්ෂණය සඳහා බළන්ගොඩ නගර සභාවේ ආදායම් පරීක්ෂක මහතා යොදවා ඇති අතර ගැටලු සහගත තත්ත්වයන් ඔහු සමග සාකච්ඡාකර විසඳා ගැනීමට වග බලා ගතයුතු වන්නේය.
- ලංසු කැඳවීමේ දැන්වීමේ සඳහන් ඉහත සඳහන් නොවුණු අනෙකුත් කොන්දේසි ද නගර සභා ආඥා පනතේ, ප්‍රඥප්ති, චක්‍රලේඛ විධිවිධාන සහ අතුරු ව්‍යවස්ථාවන් හි සඳහන් කොන්දේසි පිළිපැදිය යුතු ය.

ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත්, කොන්දේසි සියල්ල කියවා තේරුම්ගත් බවත්, බළන්ගොඩ බස්නැවතුම්පලෙහි පෞද්ගලික බස්ගාල් ගාස්තු අයකිරීම පිළිබදව මහජන පැමිණිලි ලැබීම හෝ මෙම ගිවිසුමේ කිසියම් කොන්දේසියක් කඩ කිරීමක් හෝ සිදුවුවහොත් බළන්ගොඩ නගර සභාව විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වශයෙන් පිළිගන්නා අතර එසේ වුවහොත් මා විසින් සභාවේ තැන්පත් කර ඇති මාසික ආරක්ෂිත ඇප මුදල සභාව සතු වනබවත් දනිමි.

ටෙන්ඩර්කරුගේ අත්සන:........................................